www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ජාත්‍යන්තර කමිටුව, සහ ඉදිරිදර්ශනයේ විද්‍යාවඃ ඇමරිකානු අධිරාජ්‍යවාදය පිලිබඳ ඓතිහාසික විශ්ලේෂනයක්

**Marxism, the International Committee, and the science of perspective: an historical analysis of the crisis of American imperialism**

**තුන්වන කොටස**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 ජනවාරි 13**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) ජනවාරි 8-9 සති අන්තයේ මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර්හි දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවැත් විය. ආරම්භක වාර්තාව සපයන ලද්දේ සසප ජාතික ලේකම් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් විසිනි. අද අපි මෙම වාර්තාවේ තුන්වන හා අවසන් කොටස පල කරමු. පලමුවන කොටස ජනවාරි 11 දා පල කරන ලද අතර දෙවන කොටස ජනවාරි 12 පල කරන ලදි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පැන නැගී එන්නා වූ විප්ලවවාදී අර්බුදයක පහත සඳහන් තීරනාත්මක අංගයන් 1988 දී සම්මත කර ගත් ඉදිරිදර්ශන යෝජනාවේ දී අනන්‍ය කර ගත්තේ ය.

1. ලෝක වෙලඳපලේ ඓතිහාසිකව පෙර නුවූ විරූ ඒකාග්‍රකරනය සහ පාරජාතික සංගත තුලින් ආයතනික ප්‍රකාශනයක් අත් කර ගන්නා නිෂ්පාදන සන්තතියේ ගෝලීය ඒකාග්‍රකරනය. මෙම ගෝලීය සන්තතිය ලෝක ආර්ථිකය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර අති මූලික ප්‍රතිසතිතාව උත්සන්න කර තිබේ.

2. ඇමරිකා එක්සත් ජනපදයට පැවති ගෝලීය ආධිපත්‍යය නැති වී යාම. මෙය වනාහී එක්සත් ජනපදය නයහිමි රාජ්‍යයක සිට නයගැති රාජ්‍යයක් බවට ප්‍රතිවර්තනය වීම තුල ප්‍රකාශනයක් අත් කර ගත් ඓතිහාසික වෙනසකි. එක්සත් ජනපදයේ ප්‍රපාතීය ආර්ථික පරිහානිය කම්කරු පන්තියේ පලල් කොටස්වල ජීවන තත්වයන්ගේ පිරිහීමේ මූලික සාධකය විය.

3. ලෝක වෙලඳපල තුල එක්සත් ජනපදයේ තැනට ජපානය සහ යුරෝපය සෘජුව අභියෝග කිරීමත් සමග අන්තර්-අධිරාජ්‍ය ඝට්ටනය උග්‍ර වීම.

4. කාර්මික කම්කරු පන්තියේ මුලුමනින්ම අලුත් සේනාංක නිර්මානය කිරීමට මග පෑදූ ආසියානු පැසිෆික්-සීමා ආර්ථිකයන්ගේ වේගවත් ප්‍රසාරනය. මීට සමාන ප්‍රවනතා අප්‍රිකාවේ ද ලතින් ඇමරිකාවේ ද දක්නට ලැබිනි. ගෝලීය ආස්ථානයකින් සලකා බලන ලද කල්හි කම්කරු පන්තියේ විභව ආර්ථික හා සමාජ බලය දැවැන්ත ලෙස ශක්තිමත් වීම මෙයින් සලකුනු විය.

5. ''තුන්වන ලෝකය'' දිගින් දිගට ම දිලිඳු බවට ඇද වැටීම සහ මෙම රටවල ජාතික ධනේශ්වරයේ ගනන් නැති ''සංවර්ධන මූලෝපායන්'' මුලුමනින්ම අසාර්ථක වීම.

6. පශ්චාත් දෙවන ලෝක යුද්ධ දේශපාලන පර්යාය අස්ථායීකරනය වීම. මෙය ගලා ආවේ - සෝවියට් සංගමය, නැගෙනහිර යුරෝපය සහ චීනය - යන ප්‍රදේශවල ස්ටැලින්වාදී නිලධරය ධනේශ්වර පුනස්ථාපනයේ පිලිවෙත්වලට හැරී ගැනීමෙනි.

එම ඇගයීම ඉදිරිපත් කොට මේ වන විට අවුරුදු 17ක් ගතවී තිබේ. නව ලෝක ඉදිරිදර්ශනයක් විස්තාරනය කිරීම සඳහා 1988 දී වර්ධනය කැරුනු ඉහත සඳහන් ඉදිරිදර්ශනය පිලිබඳව තක්සේරුවක් කල යුතුව ඇත. ඉදිරි දර්ශනයක් වනාහී පොරොන්දු පත්‍රයක් (ප්‍රොමිසරි නෝට්) නොවේ. පූර්වඥානනයකි. ට්‍රොට්ස්කි සඳහන් කල පරිදි පූර්වඥානයක් සංයුක්ත වූ තරමට කොන්දේසි සහිත ද වේ.

පැරනි ආප්තයේ දැක්වෙන පරිදි ''අනාවැකි පල කිරීම ඉතා දුෂ්කර දෙයකි; විශේෂයෙන්ම අනාගතය පිලිබඳව, නොවරදින නිශ්චිත භාවයකින් අනාගතය ගැන අනාවැකි උවමනා උදවිය ලගම සිටින ජේන කියන්නා වෙතට යෙත්වා!''

ඉහත සඳහන් සීමාවන් සඳහන් කලායින් පසුව, කිව යුතුව ඇත්තේ 1988 විශ්ලේෂනය ඉතා හොඳින් තහවුරුව ඇතැයි මට විශ්වාස බව ය. මම 1988 ජාත්‍යන්තර කොමිටිය විසින් අනන්‍ය කර ගැනුනු ලෝක අර්බුදයේ මූලාංග අතුරෙන් අවසන් එකින් ආරම්භ කරන්නෙමි. එනම්: ස්ටැලින්වාදීන් වෙලඳපල-හිත පිලිවෙත් දෙසට හැරී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවෙතැයි අප අපේක්ෂා කල අස්ථායිකාරී හා විප්ලවවාදී විපාකයන් ය.

1988 ඉදිරිදර්ශනය තුල ද (එසමයෙහි අපගේ වෙනත් ලියවිලිවල ද) ග්ලාස්නොස්ට් හා පෙරස්ත්‍රොයිකා ධජය

යටතේ ගොර්බචොව් අනුගමනය කල පිලිවෙත් වනාහී ස්ටැලින්වාදයේ ප්‍රති-විප්ලවවාදී පිලිවෙත් මස්තක ප්‍රාප්ත වීමේ අවධියක් යයි අප කල අනතුරු ඇඟවීම්, පැබ්ලෝවාදී සංශෝධනවාදීන් ගෙන් අන්තිම සෝවියට් නායකයා (ගොර්බචොව්) ලද උනන්දු සහගත සහයට තියුනු ලෙස ප්‍රතිසන්දනාත්මක වූ බව පෙන්නා දීමට මට අවසර දෙන්න.

1953 දී ම මයිකල් පැබ්ලෝගේ සම චින්තකයා ලෙස ඉස්මතු වූ ද පසුකලෙක පැබ්ලෝවාදී ව්‍යාපාරයේ ප්‍රමුඛ න්‍යායඥයා වූ ද අර්නස්ට් මැන්ඩෙල් ''ගොර්බචෙව් වනාහී ලොව අතිශයින්ම දීප්තිමත් දේශපාලකයා ය'' යි ස්තෝත්‍ර කලේ ය; ගොර්බචෙව්ගේ පිලිවෙත් ධනවාදය පුනස්ථාපනය කිරීම දෙසට යොමු වූ ඒවා යයි පෙන්වා දීම ''විසුලුකර''යයි හෙලා දුටුවේ ය. මැන්ඩෙල්ගේ ගෝලයෙකු වූ තරික් අලි තම පොතක් බෝරිස් යෙල්ට්සින්ට පිලිගැන්වීම දක්වා ම දුර ගියේ ය. ඒ අතර, ගොර්බචෙව් ගේ පිලිවෙත්වල විපාක පිලිබඳ තම තක්සේරුවේ දී ජාතික ධනේශ්වරයින්ට ද එතරම් දුර දිග නොපෙනුනු බව සලකා බලන විට ඉහත කී සංශෝධනවාදීන්ගේ දුරදිග නොදැකීමට සමහර විට යම් ලිහිලක් දැක්වීමට ඉඩ තිබේ යයි (උපහාසයෙන්) කිව හැකි ය. මේ සියලු දෙනාට ම නැගෙනහිර යුරෝපයේ සහ සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී තන්ත්‍රවල හදිසි බිඳ වැටීම මුලුමනින්ම අනපේක්ෂිත ද පුදුම සහගත ද විය.

ජාත්‍යන්තර කමිටුව විසින් ස්ටැලින්වාදී තන්ත්‍රවල අර්බුදය පිලිබඳ කරන ලද විග්‍රහය සමාලෝචනය කරමින් නිර්භයව කිව හැක්කේ අප 1989-1991 මහ පෙරලි පූර්වාපේක්ෂා කල බව ය. මෙයට තියන්ආන්මෙන් චතුරස්‍රයේ මහා සංහාරයෙන් කූටප්‍රාප්ත වූ චීන කම්කරුවන්ගේ හා ශිෂ්‍යයන්ගේ යෝධ කැරැල්ල ද අන්තර්ගත වේ. පෙර දැකිය නොහැකි වූයේ ස්ටැලින්වාදී තන්ත්‍රවල අර්බුදයේ තත්ක්ෂනික දේශපාලන ප්‍රතිඵලය ය. මෙම අර්බුදය තුල දී පැහැදිලි වූ දෙයක් නම් අන් සියල්ලටමත් වඩා කම්කරු පන්තියේ හා බුද්ධිමතුන්ගේ සමාජවාදී ප්‍රවනතාවලට එරෙහිව යොමු කරන ලද දශක ගනනාවක ස්ටැලින්වාදී මර්දනය මහ ජනතාවගේ විඥානයට දරුනු සේ තුවාල කර තිබුනු බව ය. කලෙක කම්කරු පන්තියේ පුලුල් කොටස් ආස්වාදිත කල සමාජවාදී විඥානයෙන් මේ වනවිට ඉතුරු වී තිබුනේ අල්ප මාත්‍රයක් පමනි. නිලධාරී තන්ත්‍රය විසින් ම දිරි ගන්වා යොමු කැරුනු අයුරු, නැගෙනහිර යුරෝපයේ ද සෝවියට් සංගමයේ ද මහ ජන විරෝධතාවෝ ධනේශ්වර-හිත පිලිවෙත් දිගේ මෙහෙයවනු ලැබූහ. එහෙයින් ප්‍රති ස්ටැලින්වාදී කැරැල්ලේ ප්‍රාරම්භක ප්‍රතිඵලය වූයේ ධනේශ්වර ක්‍රමය පුනස්ථාපනය කිරීමට යොමු වූ පාලන තන්ත්‍රයන් ඒ රටවල ඇටවීම ය.

එහෙත් විශේෂයෙන් ම 1989 සිට 1991 දක්වා වූ සිද්ධීන්ගේ වඩාත් පෘථුල ඓතිහාසික අන්තර් සම්බන්ධතාවයන් සලකා බලන කල්හි ජාත්‍යන්තර කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉදිරි දර්ශනය අවලංගු කෙරෙන්නේ නැත. නැගෙනහිර යුරෝපයේ ද සෝවියට් සංගමයේ ද ස්ටැලින්වාදී තන්ත්‍රයන් අවසාන විග්‍රහයේ දී විසුරුවා හරිනු ලැබුවේ කුමක් විසින් ද? පරස්වාචකව, ජාත්‍යන්තර කමිටුවේ ලෝක ආර්ථික අර්බුදය පිලිබඳ විශ්ලේෂනයේ දී අනන්‍ය කරනු ලැබූ එම ආර්ථික ප්‍රවනතාවන්හි පීඩනයට - එනම් ආර්ථික ගෝලීකරනයේ වේගවත් වීමට - අඩුවෙන් ම ඔරොත්තු දිය හැකි වූයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ට ය. මෙයට අදාල වනුයේ නැගෙනහිර යුරෝපයේ හා සෝවියට් සංගමයේ ආර්ථික පසුගාමී බව නොවේ; ස්වයං පෝෂිත ජාතික ආර්ථික රාමුව ක්‍රියාත්මක කිරීම දුෂ්කර කලේ එම ආර්ථිකයන්ගේ එන්න එන්නම තියුනු වූ සංකීර්න භාවය ය. එම ආර්ථිකයන් ලෝක ආර්ථික පීඩනයන්ට වැඩි වැඩියෙන් විවෘත වත් ම, ඒවා ජාත්‍යන්තර වෙලඳාම ප්‍රසාරනය කරමින් ද ජාත්‍යන්තර ආයෝජන දිරි ගන්වමින් ද ජාත්‍යන්තරව නය සොයායමින් ද ලෝක වෙලඳපලේ සම්පත් කරා ප්‍රවිශ්ට වීමට ආවශ්‍යයේ බලපෑම යටතේ පෙලැඹුනු කල්හි, එමගින් ඔවුන් කලේ තම කෘත්‍රිම ලෙස ආරක්ෂිත රාජ්‍යසන්තක ව්‍යවසායයන් මුහුන දී නැගී සිට ගැනීමට සූදානම් නොවූ බව ප්‍රදර්ශනය කල ලෝක ආර්ථික පීඩනයන්ට ගෝචර කර දැමීම ය.

ගොර්බචෙව්ගේ වෙලඳපල-හිත පිලිවෙත්වලට සෝවියට් කම්කරු පන්තියේ ප්‍රාරම්භක ප්‍රතිචාරය වූයේ - විශේෂයෙන්ම පතල් කම්කරුවන්ගේ - ඉතා සටන්කාමී වැඩ වර්ජන මාලාවකි. කම්කරු පන්තියේ වමට නැඹුරු ව්‍යාපාරයක් පැනනගිතැයි වැඩිවැඩියෙන් බියට පත් ස්ටැලින්වාදී නිලධරයෝ තමන්ගේ බංකොලොත් පාලන තන්ත්‍ර බිඳ වැටීමෙන් පසු, ධනේශ්වර-හිත කොටස්වලට බලය ලැබේ යයි සහතික කරලීම සඳහා තමන්ට හැකි සෑම දෙයම කලාහ; මෙහිදී ඔවුහු සාර්ථක වූහ. එහෙත් මෙම මහා පෙරලිවල දේශපාලන ප්‍රතිවිපාක ඒවායේ ආර්ථික මූලාශ්‍රය පැවැතියේ ගෝලීකරනය විසින් ගමන් කැරැවුනු පුපුරන සුලු ආර්ථික සන්තතීන් තුල ය යන්න වෙනස් කරන්නේ නැත.

දේශපාලන රූපාකාරය පිලිබඳ ප්‍රශ්නය නිරර්ථ එකක් නොවේ. අපි ස්ටැලින්වාදී පාලන තන්ත්‍රයන්ගේ බිඳ වැටීමේ දේශපාලන විපාක නොතකන්නෝ නොවෙමු. නැගෙනහිර යුරෝපයේ, පැරනි සෝවියට් සංගමයේ හා චීනයේ ධනවාදය පුනස්ථාපනය විසින් ලෝක දේශපාලන වර්ධනයන් මත, තව දුරටත් කිව හොත්, 1990 ගනන් හා 21 වන ශතවර්ෂයේ ප්‍රථම දශකය තුල ලෝක ආර්ථිකය මත අති දැවැන්ත බලපෑමක් ඇති කර තිබේ.

මෙම රටවල ධනවාදය පුනස්ථාපනය කිරීමේ විපාකවල පරිමාව වටහා ගැනීමට නම් අප විසින් පහත සඳහන් ප්‍රශ්නය ඇසීම ම සෑහේ. ''නැගෙනහිර යුරෝපයේ සෝවියට් සංගමයේ හා චීනයේ සිද්ධීන් ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී කම්කරු පන්තික පාලන

තන්ත්‍ර බලයට පත් කිරීමෙන් අවසන් වී නම් අද දින ලෝකය කෙබඳු වනු ඇත් ද? අවම වසයෙන් ගතහොත් වෝල්වීදියේ සහ ලෝක කොටස් වෙලඳපලවල ඉහල නැගීමට ඉන්ධන දුන් සමපේක්ෂන උද්දාමය අපට දැකගන්නට ලැබේද යන්න ගැන මට බෙහෙවින් සැක ය. සෝවියට් සංගමයේ බිඳ වැටීම ඇමරිකානු සහ ජාත්‍යන්තර ධනේශ්වර පන්තියේ ආත්ම විශ්වාසය තාවකාලිකව හෝ ඉහල දැමූ බවට සැකයක් නැත. විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයට, සෝවියට් සංගමයේ බිඳ වැටීම තම මිලිටරි බලය පාවිච්චි කිරීම සඳහා දැවැන්ත නව ඉඩකඩ ලබා දුන්නේ ය.

එහෙත් අපි ලෝක ධනවාදයේ තත්වය ද 1988 ලියවිල්ල තුල අනන්‍ය කර ගත් ජාත්‍යන්තර අර්බුදයේ අනෙක් අංගයන්ගේ රාමුව තුල හා සමස්තය වසයෙන් ගත් කල්හි පශ්චාත් බ්‍රෙට්න්වුඩ්ස් තත්වයේ වඩාත් පෘථුල සන්දර්භය තුල එක්සත් ජනපදයේ ස්ථානය ද සලකා බැලුවහොත් වඩාත් යථාර්ථවත් පින්තූරයක් දැක ගත හැකි වනු ඇත. 1988 දී ජාත්‍යන්තර කමිටුව පෙන්නුම් කල අර්බුදයේ සියලු අංගයෝ 2005 දී ද පවතිත් ම ය; ඇත්ත වසයෙන්ම, වඩාත් උග්‍ර ද භයානක ද බවට වැඩී ඇත්තා හ.

ඓතිහාසික වසයෙන් සලකා බැලූ කල්හි - සෝවියට් සංගමයේ බිඳ වැටීම ලෝක ධනේශ්වර පද්ධතියේ නිදන්ගත රෝග සුව කලේ නැත; ධනවාදයේ ප්‍රගතිශීලී වර්ධනය සඳහා නව දෘෂ්ටි පථයක් නිර්මානය කර දුන්නේ ද නැත. ඒ වෙනුවට එය විසින් ඉටු කරන ලද්දේ ධනවාදයේ මාරක රෝගයන් වගා කිරීම සඳහා නව ප්‍රදේශ විවෘත කර දීම ය. සෝවියට් සංගමය විසුරුවා හැරීමට පසු ගතවූ දශක එක හමාරක කාලය තුල දී සිදු වී ඇත්තේ ආර්ථික ගෝලීය කරනයේ අනිවාරනීය ක්‍රියාවලීන් ද යල් පැනගිය ජාතික රාජ්‍ය පද්ධතියේ නොසෙල්විය හැකි අවශ්‍යතා ද අතර ප්‍රතිසතිතාවේ භයංකර උග්‍ර වීම ය. ප්‍රධාන අධිරාජ්‍ය බලවතුන් සමග ඓතිහාසික ගැටුම් ගත හොත් ඒවා සෝවියට් සංගමය බිඳවැටීම මගින් තවතවත් උග්‍ර වී පවතී. සෝවියට් සංගමයේ පැවැත්ම දෙවන ලෝක යුද්ධයෙන් පසු සමයේ ධනේශ්වර රාජ්‍යයන් අතර සට්ටනය කරා තිබුනු ප්‍රවනතාවය සීමා කල සාධකයන්ගෙන් එකක් ලෙස පැවතුනි. පසුගිය පසලොස් වසර ආසියානු කම්කරු පන්තියේ ප්‍රමානයේ හා ශක්තියේ තව දුර දැවැන්ත වර්ධනයක් අත් දුටුවේ ය.

1988 ලියවිල්ල එක්සත් ජනපදයේ ආර්ථික පිරිහීම ද එහි විපාකයක් ලෙස එරටේ අධිපති තත්වය නැතිවී යාම ද යන කරුනුවලට බලගතු- අවධාරනයක් දුනි. එහෙත් මේ සන්තතිය පසුගිය 17 වසර තුල, ආපසු කැරකී නැත; මිලිටරි බලය පාවිච්චි කිරීම මගින් එවන් ආපසු කැරකීමක් ඇති කර ගැනීමට එක්සත් ජනපදය දැරූ ප්‍රයත්න සාර්ථක වී ද නැත.

සත්තකින්ම තම භූගෝලීය ඉලක්කයන් අත්කර ගැනීම සඳහා එක්සත් ජනපදය වඩවඩාත් ඉවබව නැති ලෙස ප්‍රචන්ඩ බලය යෙදීමට දරන්නා වූ ප්‍රයත්නය විසින් පෙන්නුම් කෙරෙන්නේ ආර්ථික බලයේ පිරිහීම පමනක් නොව, ඇමරිකාවේ මුදලට වියරු වැටුන පාලක ප්‍රභුවේ ගැඹුරු අවමංගත වීමය.

කලින් මම මගේ වාර්තාවේ දී බ්‍රෙට්න්වුඩ් පද්ධතියේ බිඳවැටීම ගැන සඳහන් කලෙමි. මෙය පශ්චාත් යුදකාලීන ධනවාදයේ ඉරනමෙහි සන්ධිස්ථානයක් යැයි මම පැහැදිලි කලෙමි. ඩොලර්-රත්රන් හුවමාරු කිරීම මත පදනම් වූ පද්ධතියක අවසානය ඇමරිකානු ධනවාදයේ ගෝලීය ආර්ථික පද්ධතියේ සීමාවන් එලිදරව් කොට ආර්ථික පරිහානියේ දිග්ගැසුනු සන්තතියක ගමන ආරම්භ කලේ ය. ඇමරිකානු ආයුධ ගබඩාවේ වෙඩිබලය මතට වඩා එරටේ හිඟ සහ නය ප්‍රමානයන් කෙරෙහි අවධානයක් යොමු කරන්නා වූ ඇමරිකානු ධනවාදයේ වර්තමාන ආර්ථික ආස්ථානය පිලිබඳ පරීක්ෂනයක් පැහැදිලිව පෙන්නුම් කරන්නේ 1971 අගෝස්තු මාසයේ බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ බිඳ වැටීම සමග විවෘත වූ අර්බුදයේ ඉතා තියුනු අවස්ථාවකට දැන් එලඹ සිටින බව ය.

## එක්සත් ජනපද පරිහානියේ වෛෂයික ආර්ථික දර්ශකයෝ

පසුගිය දශකය තුල ඇමරිකානු ආර්ථිකයේ තත්වය පිලිබඳව ජාත්‍යන්තර මූල්‍ය කවයන් තුල එන්න එන්න ම වැඩිවන කනස්සල්ලක් ප්‍රකාශිතව තිබේ. විශේෂයෙන්ම, ඔවුන්ගේ මනස්තාපයට හේතු වී ඇත්තේ එ රටේ ශුද්ධ ජාත්‍යන්තර ආයෝජක තත්වයේ (එන්අයිඅයිපී) සහ ප්‍රවර්තන ගිනුම් හිඟයේ යෝධ ප්‍රමානයද එක්සත් ජනපද ඩොලරයේ වටිනාකම මත ඇති කර තිබෙන අහිතකර බලපෑම ද විසිනි. මෙම හිඟයන් විසින් ද ඩොලරයේ අගය පහත වැටීම තුලින් ද පැන නංවා ඇති මනස්තාපයේ තියුනු බව පිලිබිඹු කරන්නේ මේවා හුදු ඇමරිකානු ගැටලු නොවන බව ය. ඒවා ලෝක ගැටලු බවය.

අවුරුදු 35ක් ගතවීමෙන් ඉක්බිතිව ද, ලෝක ධනේශ්වරය බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය වෙනුවට ස්ථාවර විකල්පයක් සොයාගැනීමට අසමත් වී සිටී. දැනට පවත්වා ගෙන යනු ලබන පාවෙන හුවමාරු අනුපාතික පද්ධතිය කවර කලෙකවත් වේලාව පිරිමසාගන්නා සැලසුම් මාලාවකට වැඩි දෙයක් ලෙස පැවතී නැත. එම සැලසුම් මාලාව ලෝක මූල්‍ය හුවමාරු මධ්‍යස්ථානවල බරපතල කලබැගෑනි තත්වයකට නිරන්තරව විවෘතව පවතී. 1971ට පෙර ඇමරිකානු ඩොලරය ලෝක මූල්‍ය ස්ථාවරත්වය සහතික කලේ ය. දැන් එය ලෝක මූල්‍ය අස්ථාවරත්වයේ ප්‍රධාන මාධ්‍යය බවට පත්ව ඇත. මෙම භයංකර තත්වය පැන නංවා ඇත්තේ ලෝක මූල්‍ය වෙලඳපලවල් තුල ඩොලරයේ අගය කොතරම් උච්චාවචනය වුවත් එය ලෝකයේ ප්‍රධාන සංචිත මූල්‍යය ලෙස තවමත් පවතින්නේ ය යන කරුනිනි. මේ සංසිද්ධිය පිලිබඳව කරුනු ගනනාවක් ඉදිරිපත් කල යුතුව ඇත.

මුලින්ම මුල්‍ය කලබැගෑනිවල අවසාන අර්ථභාරය වන්නේ ජාතික රාජ්‍යය දිගින් දිගට පැවත්ම තුලින් කැබලි කරන ලද ලෝක ආර්ථිකයක් තුල පවත්නා අතිමූලික අසමතුලිත භාවයන් ඒවා විසින් ප්‍රකාශයට පත් කරන බව ය. ලෝක ආර්ථිකය තනි, සාර්වත්‍රිකව වලංගු සහ ස්ථාවර ලෝක මුදලක් මගින් ඉමහත් ලෙස උත්තේජනය වනු ඇත. 1940 ගනන්වල දී ම මෙය ධනේශ්වර පන්තියේ වඩාත් දුරදිග දක්නා නියෝජිතයන් විසින් වටහා ගන්නා ලදී. ෆ්‍රැන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට් තනි ලෝක මූල්‍යයක් පිහිටුවිය යුතු යයි යෝජනාව ගැන සෙල්ලමට මෙන් සිතා බැලී ය; එයට ''යුනිටාස්'' යන නම යෝජනා කල ඔහු එබන්දක් ක්‍රියාත්මක කිරීමේ පිඹුරුපතක් සකස් කරන මෙන් තමාගේ සමාජවාදී ලැදියාවක් පැවති ආර්ථික උපදේශකයාවූ, හැරී ඩෙක්සර් වයිට් ට යෝජනා කලේ ය. සෑම විටම යථාර්ථවාදියෙකු වූ රූස්වෙල්ට් සිය සමාජ පරහිතතාවයේ මෙම සුවිශේෂී උදාහරනය ඇමරිකානු ධනවාදයේ අවශ්‍යතා සමග නොසැසඳෙන බව වටහා ගති. යෝජනාව තිඹිරි ගෙයි ම මලේ ය. අර්ථභාරීව, ඒ සමගම බ්‍රිතාන්‍ය අර්ථශාස්ත්‍රඥ ජෝන් මේයිනාර්ඩ් කේන්ස් ලෝක මුදලක් සඳහා තමාගේම සැලැස්මක් වර්ධනය කර ගනිමින් සිටියේ ය. ඔහු එයට ''බැන්කෝර්'' යන නම දුනි. එහෙත් ඇමරිකානු සහාය නොලත් කල්හි. මෙය එය බ්‍රිතාන්‍යයන්ගේ ව්‍යවහාරයට අනුව ''ස්ටාට් නොවන'' එකක් විය. ධනවාදය යටතේ යම් මුදල් වර්ගයක් ක්‍රියාත්මක වන්නේ එම මුදල නිකුත් කරන්නා වූ රාජ්‍යයේ. ධනේශ්වර පන්තියේ පනිවුඩකරු හැටියට ය. මේ අනුව එම මුදල විසින් නියෝජනය කෙරෙන රාජ්‍යයේ ජාතික මූල්‍ය පිලිවෙත ද ලෝක ආර්ථිකයේ පොදු යහපත ද අතර යම් සම්පතනයක් වේ නම් එය සහතිකෙන් ම අගනේ ය. එහෙත්, අවසාන විග්‍රහයේ දී එය එවන් සම්පතනයක් මත නොරැඳිය යුතු ය.

දෙවනුව, ඇමරිකා එක්සත් ජනපදය 1942 පටන් එහි ඩොලර් මුදල ලෝකයේ ප්‍රධාන සංචිත මුදල ලෙස දරා සිටි වරප්‍රසාදිත තත්වයෙන් දැවැන්ත වාසියක් අත්පත් කර ගති; එ රට දැනුදු එවැන්නක් භුක්ති විඳිමින් සිටී. ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවල මාධ්‍යය ලෙස ඩොලරය යොදාගන්නා තාක්දුරට, ඒ හෙයින් එය ලෝකය පුරාම මහ බැංකු විසින් කැමැත්තෙන් ම ඒකරාශී කර තබා ගන්නා තාක්දුරට, ඇමරිකා එක්සත් ජනපදය, අන් සියලු රටවල් මත පැටැවෙන, මූල්‍ය හා අය වැය සීමාවන්ගෙන් විනිර්මුක්ත වේ; අන් කුමන රටක වුව සම්බන්ධයෙන් ඉඩ දියහැකැයි සලකන සීමාවෙන් බෙහෙවින් විශාල වූ ප්‍රවර්තන ගිනුම් හිඟයක් පවත්වාගෙන යාමට ඇමරිකා එක්සත් ජනපදයට ඉඩ සලසනු ලැබේ. කෙසේ වෙතත්, එක්සත් ජනපදයට වුව, හිඟයේ ප්‍රමානය මනස්තාපයට පමනක් නොව බියට පවා හේතුවන්නා වූ තත්වයක් උදා වන්නේ ය. 'අතන ට්‍රිලියනයක් නය, මෙතන ට්‍රිලියනයක් නය'. කෙනෙකු කතා කරන්නේ 'සැබෑ මුදල්' ගැන බව කියමනේ දැක්වෙන පරිදි හදිසියේ ම පැහැදිලි වේ. තමන්ගේ ආරක්ෂිත සේප්පුවල ගොඩගැහෙන ඩොලර් මුදල්වල සැබෑ අගය කුමක්ද යි සිතන එවිටය මහ බැංකු පාලකයන්ට හීන්දාඩිය දමන්නට පටන් ගන්නේ, නොනිදා පහන් කරන්නට සිදුවන්නේ ද එවිට ය.


තුන්වෙනුව, වත්මන් ඩොලර් අර්බුදය එලඹෙන්නේ එක්සත් ජනපද මූල්‍යයේ ගෝලීය ස්වයං ආධිපත්‍යය ඉයුරෝ මුදලෙන් ඓතිහාසිකව නුවූ විරූ අභියෝගයකට, මුහුන දී සිටිනා තතු තුල ය. පසු ගිය අඩ සියවස තුල ලෝක ආර්ථිකයේ ඉතා වැදගත් සිද්ධීන් දෙක වූයේ ''පලමුව 1971 බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය බිඳ වැටීම ය, දෙවනුව ඉයුරෝ මුදල දියත් කිරීම ය''යි. නොබෙල් ත්‍යාගලාභී රොබට් මුන්ඩල් මෑත දී ලිවී ය.

ලෝක සංචිත මුදලක් ලෙස ඩොලරයට එරෙහි විකල්පයක් හැටියට පිලිගැනීමෙන් ලබන්නා වූ මුදලක් දැන් අපට දෙවන ලෝක යුද්ධයෙන් පසු ප්‍රථම වතාවට දැක ගන්නට ලැබෙයි. දැනටම, ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවලින් සැලකිය යුතු සහ වේගයෙන් වැඩිවෙන පංගුවක් ගනන් බැලෙන්නේ ඉයුරෝවලිනි. මෙය ඇමරිකා එක්සත් ජනපදය මත මූල්‍ය පීඩනය උග්‍ර කරයි.

විශේෂ පුවත්පත් ලේඛක චාර්ල්ස් ක්‍රව්තැමර් වැනි මායාවී දක්ෂිනාංශික උන්මත්තකයන් එක්සත් ජනපදයේ ආධිපත්‍යය යටතේ ඒක ධ්‍රැවීය ලෝකයක් පැන නැගීම ගැන ජය ඝෝෂා නගන අතර ලෝක මූල්‍ය වෙලඳපලවල් ඉතාම නිශ්චිතව ද්වි-ධ්‍රැවාන්ගතව පවතී. ඇමරිකානු ආධිපත්‍යයේ තවත් මූලෝපායඥයෙක්වූ, වෝල්ටර් රසල් මීඩ් ඉරාකය සමග යුද්ධයට දැක්වෙන යුරෝපීය විරෝධය පිලිකුලෙන් බැහැර කරයි; ඇමරිකා එක්සත් ජනපදය යථා කාලයේ දී ප්‍රන්ස බාධාකාරයින් සමග ද ගනු දෙනු බේරා ගනු ඇතැයි ඔහු අනාවැකි පල කරයි. ඒ සමගම ඔහු නරුම උපහාසයෙන් මෙසේ ද එකතු කරයි: ''පලිගැනීම නමැති ආහාරය වඩාත් රසවත් වන්නේ සීතල කොට අනුභවයට ගත්තොතිනි'' එහෙත් එම ආහාරවේලට අවශ්‍ය කලමනා සඳහා කරන ගෙවීම බොහෝවිට එක්සත් ජනපදයට කරන්නට සිදුවනු ඇත්තේ ඉයුරෝ මුදල්වලින් ය යන්න ඔහු අමතක කරයි.

ඇමරිකානු යුදවාදයේ පුපුරා යාම ගැඹුරින්ම සම්බන්ධවී ඇත්තේ එරට මුහුන දෙන මෙම අවාසි සහගත ආර්ථික ප්‍රවනතාවයන්ට ය. තම ආර්ථික බලයේ පිරිහීම මිලිටරි බලය පාවිච්චි කිරීම මගින් ආපසු කරකවාගත නොහැකි නම් අඩුගනනේ ඊට හිලව් වසයෙන් හෝ ගෝලීය මූලෝපායික වාසියක් අත් කර ගැනීම සඳහා පාවිච්චි කිරීම සමග එක්සත් ජනපදයේ යුදවාදයේ වත්මන් පුපුරා හැලීම බැඳී ඇත. එහෙත් දැවැන්ත යුද අවි ගබඩාවක් නඩත්තු කිරීමේ ද ලෝක පරිමාන යුද මෙහෙයුම් පවත්වාගෙන යාමේ ද වියදම යටින් පවත්නා මූල්‍යමය ගැටලුව තවතවත් උග්‍ර කර දමයි. යෝධ යුද වියදම විසින් ප්‍රවර්තන ගිනුමේ හිඟය තව දුරටත් උග්‍ර කෙරෙනු ඇත. ඩොලරය තවතවත් දුබල වීම සමග ඉයුරෝව වඩා ආකර්ශනීය වී

**වගුව 1**





ඩොලරයකට ගෙවිය යුතු ඉයුරෝ ගනන (මාසික සාමාන්‍යය) 2001-2004. මූලාශ්‍රය www.x-rates.com

විකල්පයක් සේ සලකනු ලබන්නට පටන්ගැනේ. පසුගිය වසර තුන තුල ඩොලරය ඉයුරෝවට සමානුපාතිකව 35% කින් පිරිහී ගොසිනි. (පලමුවන වගුව බලන්න) ඒ අනුව එක්සත් ජනපදය හසු වී තිබෙන්නේ ගොඩ ඒමට තර්කාන්විත මගක් නැති ප්‍රතිපත්ති පිලිබඳ අවුලකට ය.

ඉයුරෝවට සම්බන්ධව මෙ ද කිව යුතු යː එහි ආකර්ශනීය භාවය සාපේක්ෂක මිස පරම ස්වභාවයක්

**වගුව 2**




එක්සත් ජනපද අපනීත සහ ආනීතයෝ, 1960-2002. මූලාශ්‍රයː යූඑස් බියුරෝ ඔෆ් ඉකොනොමික් ඇනැලිසිස්

2002 දී ඩොලර් බිලියන 420ක් පමන විය. 2004 දී එය බිලියන 500 ඉක්මවිය. 2005 දී එය බිලියන 600 ඉක්මවතැයි අපේක්ෂා කෙරේ. ඇමරිකානු එක්සත් ජනපදයේ ශුද්ධ ආයෝජන තත්වය - (එන්අයිඅයිපීය) ''විදේශයන්ට එක්සත් ජනපදය මත පවත්නා සමස්ත හිමිකම් (නය හා කොටස් අයිතිය හැර) වලින් සෙසු ලෝකය මත පවත්නා ඇමරිකානු හිමිකම් අඩු කල කල්හි''[1] - 1997 දී ඩොලර් බිලියන -360ක සිට 2003 දී ඩොලර් ට්‍රිලියන -2.65ක් දක්වා ඉහල නැග තිබේ. 2004 දී මෙය ඩොලර් ට්‍රිලියන -3.3 දක්වා ඉහල නගිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය වනාහි ඇමරිකා එක්සත් ජනපදයේ දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 24කි. 1989 දක්වා එක්සත් ජනපදයේ එන්අයිඅයිපීය ධනව පැවතුනි. 1995 දී එය ඩොලර් -306 බිලියනයක් පමනක් විය. එහෙත් 1999 දී හිඟය ඩොලර් -1 ට්‍රිලියනයක් දක්වා ඉහල නැග ඇත. මෙම රුධිර ගලනය දිගින් දිගටම සිදුවනු ඇතැයි සැලකේ. එක්සත් ජනපදය දිගටම යෝධ ප්‍රවර්තන ගිනුම් හිඟ පවත්වාගෙන යනු ඇත. 2004 එරටට ඩොලර් බිලියන 665ක් නයට ගැනීමට සිදු විය. (3 වගුව බලන්න) බුෂ් ද ඔහුගේ සමීපතම පිරිවර ද හැරෙන්නට මේ තත්වය දිගින් දිගට ම පවත්වාගෙන යා හැකි යයි විශ්වාස කරන වෙන කිසිවෙක් නැත.

ප්‍රවර්තන ගිනුම් හිඟය ෆෙඩරල් අයවැය හිඟයේ කම්පාකාරී වැඩී යාම විසින් උග්‍ර කරනු ලැබ ඇත. (4 වගුව බලන්න)

භාන්ඩාගාර ලේකම් රොබට් රුබින් සහ සුප්‍රසිද්ධ අර්ථශාස්ත්‍රඥයින් වන ඇලන් සිනායි සහ පීටර් ඕර්ස්සාග් එක්ව ලියන ලද ලිපියකින් උපුටා දැක්වීමට මට අවසර:

''එක්සත් ජනපද ෆෙඩරල් අයවැය ඔරොත්තු නොදෙන පාරක ගමන් කරමින් තිබේ. අර්ථභාරී පිලිවෙත් මාරුවක් කරනු නොලැබී නම් ෆෙඩරල් අයවැය හිඟය ඊලඟ දශකය ඇතුලත ඩොලර් ට්‍රිලියන 5ක් පමන වෙතැයි අපේක්ෂා කෙරේ. එවන් හිඟ තුලින් එක්සත් ජනපද ආන්ඩුවේ නය, දල ජාතික නිෂ්පාදිතයට සමානුපාතිකව බලගතු ආකාරයකට ඉහල නගිනු ඇත. සෞඛ්‍ය සේවා සහන, ආන්ඩුවේ හිඟ සහ නය ඊටත් වඩා තියුනු ලෙස ඉහල නගිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාතියේ ප්‍රක්ෂේපිත අයවැය අසමතුලිතතාව දැන් කොතරම් විශාල දැයි කිව හොත් දරුනු දුර්විපාක පිලිබඳ අවදානම - හරියටම කාල සීමා නියම කල නොහැකි වුවත් - ඉතා බරපතල ලෙස ගත යුතුව ඇත.

''(මෙම අයවැය හිඟයන්ගෙන් පැන නගින ඇමරිකා එක්සත් ජනපදය කෙරේ) දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය හංග වීමක් ඩොලර්වලින් අගය නියම කරනු ලබන වත්කම්වලින් ඉවතට ආයෝජන ගොනු (පෝර්ට්ෆෝලියෝ) තල්ලු කර දේශීය පොලී අනුපාතික ඉහලට තෙරපන පීඩනයක් ජනිත කරනු ඇත. මෙම බලවේග ම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ප්‍රමුඛ ලෝක මූල්‍යය ලෙස ඩොලරය අඩුවෙන් යොදා ගැනීමට ආයෝජකයන් හා ව්‍යවසායකයන් පොලඹවනු ඇත. මෙය පෙරලා බලපානු ඇත්තේ ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන නය මගින් සිය ප්‍රවර්තන ගිනුම්වලට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමට එක්සත් ජනපදයට පවත්නා හැකියාව සීමා කොට බලගතු හුවමාරු අනුපාතික පරිවර්තනයන්ට ජාතියේ විවෘතතාව උග්‍ර කිරීමට ය.

''පොලී අනුපාතික ඉහල නැගීම ද ඩොලරය පහත වැටීම ද එවන් අපේක්ෂිත තත්වයක් තුල ආයෝජක විශ්වාසය පිරිහී යාම ද සහතිකෙන්ම කොටස් වෙලඳපලේ මිල හා කුටුම්බීය ධනය හීන කොට ව්‍යවසායකයන්ට මූල්‍ය සම්පාදනයේ දී කිරීමට සිදුවන වියදම් ඉහල දමනු ඇත. එකල්හි මෙම විපාක මූල්‍ය වෙලඳපලේ සිට සැබෑ ආර්ථිකයට පැතිර යනු ඇත.''[2]


රුබින්, සිනායි සහ ඕර්ස්සාග් මේ වාර්තාවේ උපුටා දැක්වූ කොංග්‍රස් අයවැය කාර්යාලය (සීබීඕ) විසින් පලකරන ලද අධ්‍යයනයක් පහත සඳහන් කල්ප විනාශ සිනාරියෝව (උද්ගතවිය හැකි තත්වය පිලිබඳ චිත්‍රය) ඉදිරිපත් කලේ ය.

''විදේශීය ආයෝජකයන් ඇමරිකානු සුරැකුම්පත්වල ආයෝජනය නතර කරනු ඇත. ඩොලරයේ හුවමාරු වටිනාකම කිඳා බසිනු ඇත. පොලී අනුපාතික ඉහල යත හැකි ය. පාරිභෝගික භාන්ඩ මිල තියුනු ලෙස ඉහල යනු ඇත. නැතහොත් ආර්ථිකය තියුනු ලෙස හැකිලෙනු ඇත. පිරිහෙන ලාභ හා ඉහලයන උද්ධමනය සහ පොලී අනුපාතික අපේක්ෂිත තත්වයක් තුල කොටස් වෙලඳපල බිඳ වැටී පාරිභෝගිකයන් හදිසියේම සිය පරිභෝගය කපනු ඇත. එපමනක් නොව එක්සත් ජනපදයේ ආර්ථික ගැටලු ලෝකයේ අන් රටවල් තුලට ද උතුරා ගොස් එරටේ වෙලඳ සහකරු-රටවල ආර්ථිකයන් බරපතල ලෙස දුබල කරනු ඇත.

''ඉහල උද්ධමන පිලිවෙතක් ආන්ඩුවේ නයෙහි සැබෑ අගය පහතට හෙලනු ඇත. නමුත් දිගින් දිගටම පවතින අය වැය හිඟයන් විසඳා ලීම සඳහා ශක්‍ය මූලෝපායක් ලෙස උද්ධමනය ගත නොහැකි ය. ආන්ඩුව දිගින් දිගටම මුදල් අච්චු ගැසීම කර ගෙන ගියහොත් (1920 ගනන්වල දී ජර්මනියේ, 1940 ගනන්වල හංගේරියාවේ, 1980 ආර්ජන්ටිනාවේ සහ 1990 ගනන්වල යුගොස්ලාවියාවේ සිදු වූවාක් මෙන්) අත්‍යු'ද්ධමනයට දොර හරිනු ඇත. වරක් මූල්‍ය වෙලඳපලවල විශ්වාසය නැති හංග කර ගත් ආන්ඩුවකට යලි එය දිනා ගැනීම දුෂ්කර වනු ඇත.''

අප මෙම සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීමේ දී ද විශේෂඥයන්ගෙන් උපුටා දැක්වීමේ දී ද ඉන් අපේක්ෂා කරන්නේ ඉහත සැලකිල්ලට භාජන වූ ශක්‍යතාවන්ගෙන් කොයිඑකක් හෝ ඉහත සීබීඕ වාර්තාවේ දක්වන ලද අන්දමට ම සිදුවන්නේ ම ය යන්න නොවේ. එසේ නොවී යයි සිතීමට මේ සියලු සාධක පවතින්නේ වී නමුත්, අප උපකල්පනය කර

**වගුව 3**





එක්සත් ජනපද ප්‍රවර්තන ගිනුම් ශේෂය, 1960-2002. මූලාශ්‍රය: යූඑස් බියුරෝ ඔෆ් ඉකොනොමික් ඇනැලිසිස්

නොදරයි. ඉයුරෝව යහපත්ව කැපී පෙනෙන්නේ එය තම අවලස්සන ලොකු අයියා සමග එක පෙලට සිටගත් කල්හි පමනි.

ඉයුරෝව ප්‍රතිඵලය කොට ගන්නා යුරෝපීය සමගිය ම අභ්‍යන්තර ප්‍රතිසතිතතාවන් විසින් ඉරා දමනු ලබමින් පවතී.

දැන් අපි සංඛ්‍යා ලේඛන දෙස බලමු. දෙවන වගුවේ දැක්වෙන පරිදි -එක්සත් ජනපදයේ වෙලඳ අවාසිය

**වගුව 4**




එක්සත් ජනපද අයවැය අතිරික්ත හිඟය 1972-2003 මූලාශ්‍රය කොංග්‍රස් අයවැය කාර්යාලය (සීබීඕ). 2003 සිට සංඛ්‍යා 2003 ජුලි සංඛ්‍යාවෙන් ප්‍රක්ෂේපනය කොට ඇත.

ගත යුතු කරුනක් නම් බුෂ් පාලනය අගාධය කරා අන්ධව ගමන් කරන කල්හි එය පසුපස්සෙන් ගමන් කිරීමට සූදානම් නැති කොටස් ඇමරිකානු පාලක ප්‍රභුව තුල සිටින බව ය. ප්‍රවර්තන ගිනුමේ හිඟය දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 50-75ට නගින්නට පෙර පසුගිය වර්ෂ තුනේ දී 35%කින් වැටුනු ඩොලරයේ අගය තවත් සියයට තිහ හතලිහකින් පහත වැටීමට පෙර ධනේශ්වර පන්තියේ සමහර බලවත් කොටස් ''ගමන් මග වෙනස් කරනු ය''යි කියා සිටීමට ඉදිරිපත් වනු ඇත. එහෙත් පවතින්නේ කුමන විකල්ප ද? කුමන විකල්ප පිලිවෙතක් ක්‍රියාත්මක කල ද බරපතල අනතුරු ගම්‍ය වේ. එපමනක් නොව වත්මන් පිලිවෙත දිගින් දිගටම ගෙන ගියත්, වෙනත් කුමන විකල්පයක් යොදා ගත්තත් ඒ සියල්ල එක්සත් ජනපදයේ කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට දරුනු පහර එල්ල කිරීමට තුඩු දෙනු ඇත.

මෙම සංඛ්‍යා ලේඛනවලින් ප්‍රකාශිත වන්නාවූ යටින් පවත්නා ඓතිහාසික සන්තතිය වනාහී ඇමරිකානු ධනවාදයේ දිග්ගැසුනු පරිහානිය ය යන්න අමතක නොකල යුතු ය. ඩොලරයේ ඉරනම ඇමරිකානු කර්මාන්තයේ නිෂ්පාදක බලය හා ලෝක තත්වයට අනිවාර්යයෙන් ම බැඳී පවතී. පාලක ප්‍රභුව පිලිකුල් සහගත ලෙස ධනය ගොඩගසා ගැනීම - සත්තකින්ම වඩාත්ම පිලිකුල් සහගතව පවතින්නේ - ඇමරිකානු කර්මාන්තයේ සැබෑ නිෂ්පාදක හැකියාවෙන් එන්න එන්නම වැඩිවැඩියෙන් වියෝවී එය සිදු කරන නිසා ය. ඇමරිකානු ප්‍රාග්ධනය ලාභ ශ්‍රම උල්පත් හා ලාභ අමුද්‍රව්‍ය සොයා ලෝකය පීරා යන්නේ ඇමරිකානු කර්මාන්තයේ නිෂ්පාදන පදනම පිරිහීයමින් කම්කරු පන්තියේ පලල් කොටස්වල ජීවන තත්වය එක තැන පල්වෙමින් නැත්නම් පිරිහෙමින් පවත්නා තතු තුල ය.

එසේ නම් අපගේ දේශපාලන පූර්වඥානය කුමක් ද? ඇමරිකානු පාලක ප්‍රභුවට සාමකාමී පියවර මඟින් මෙම අර්බුදයෙන් ගැලවී ගත නොහැකි ය. මෙය එහි විදේශ පිලිවෙතට පමනක් නොව එක්සත් ජනපදය තුල ම, දේශීය පිලිවෙතට ද අදාල වෙයි. එක්සත් ජනපදයේ දේශ සීමාවලින් ඔබ්බේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ක්‍රියා කලාපය වඩාලාම ඉවබව රහිත ද මුර්ග ද වනු ඇත. තම භූ මූලෝපායික අරමුනු සඳහා යුද්ධය පිලිගත හැකි සහ උචිත මාධ්‍යයක් යයි එක්සත් ජනපද ආන්ඩුව නිර්ලජ්ජිතව ප්‍රකාශ කර ඇතැයි යන අත්‍ය'සාමානකරනය ම වටහා ගත හැක්කේ එක්සත් ජනපද ආන්ඩුවට තමන් දෙවන ලෝක යුද්ධයෙන් පසු දශකවල දරා සිටි ප්‍රමුඛ තත්වය නැති වී යාමේ පාඩුව පිරිමහ ගැනීමට වෙනත් මාවතක් විවෘතව නැතැයි යන්න එක්සත් ජනපද ආන්ඩුවම තියුනු ලෙස වටහාගෙන ඇතැයි යන කරුනිනි.

ඇමරිකාව අධිපති අධිරාජ්‍ය බලවේගය ලෙස තම තත්වය දිගින් දිගට ම පවත්වා ගෙන යාමට නම් මැද පෙරදිග ද ආසියාවේ ද අත්‍යවශ්‍ය තෙල් හා ස්වාභාවික ගෑස් නිධි අල්ලා ගත යුතු ය. එපමනක් නොව ඇමරිකාව - යුරෝපයට ද ජපානයට ද අමතරව චීනය හා ඉන්දියාව ද ඇතුලත් - අනෙකුත් ප්‍රමුඛ බලවතුන් ට මෙම තීරක සම්පත් බෙදා දිය යුත්තේ කෙසේ ද යන්න ගැන අවසාන තීන්දුව තමන්ගේ අත තබා ගත යුතු ය. අවසාන වසයෙන් මෙම තෙල් මිල ගනන් නියම කල යුත්තේ ඩොලර්වලින් මිස ඉයුරෝවලින් නොවේ යයි ද වග බලාගත යුතු ය.

එහෙත් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ලේවැකි ඇජෙන්ඩාව (න්‍යාය පත්‍රය) තීරක මූල්‍ය සම්පත් ආර්ථිකයේ සමාජමය අංශයෙන් ඉවතට යුද්ධමය අංශ කරා යොමු කිරීම ඉල්ලා සිටී. දැනටම එක්සත් ජනපදය තුල පවත්නා සැලකියයුතු සමාජ ආතතීන් දරුනු ලෙස උග්‍ර නොකොට මෙය ඉටු කර ගත නොහැකි ය. බුෂ් පාලනාධිකාරයට කලහැක්කේ කුමක් ද? යහපත් පහසු පිලිතුරු ඇත්තේ නැත. පැහැදිලිව මතුව තිබෙන වෙනස්කම් සැලකිල්ලට ගෙන බලන කල්හි, බුෂ් පාලනාධිකාරය තමන්ම ප්‍රකාශ කරගත් සහ ව්‍යාජ ''ත්‍රස්ත විරෝධී සංග්‍රාමය'' සිවුවන වසරට ඇතුලුවත්ම මුහුන දී සිටුනා තත්වය යම් තරමකට දෙවන ලෝක යුද්ධය ආසන්නයේ දී 1930 ගනන්වල නාසි පාලන තන්ත්‍රය විසින් මුහුන දෙන ලද තත්වයට බිය හඟවන ලෙස සමාන වේ.

තීක්ෂන ඉතිහාසඥයෙකු සඳහන් කල පරිදි,


''නාසීන්ගේ පැත්තෙන් ගත් කල්හි ඔවුන්ට 1938/39 දී ආර්ථික හා සමාජ පිලිවෙත් පිලිබඳ ගැටලුවට නිසැක විසඳුමක් නොතිබුනු බව පෙනී යයි. 1938 මුල සිට යුද්ධය සඳහා බලෙන් උග්‍ර කැරුනු සූදානම සෑම පැත්තකින් ම සංචිත හා ධාරිතාව බිඳෙන තැනට ම ආතතිය උග්‍ර කර තිබුනි....දුෂ්කරතා..එකට පොදි ගැසී සමස්ත ආර්ථික හා පාලක පද්ධතියේ සියල්ල වෙලා ගත් අර්බුදයක් ලෙස පැවැතුනි.

මෙහි හදවතේ පැවැත්තේ සමාජ නිෂ්පාදිතය මිලිටරි හා සිවිල් අවශ්‍යතාවන් අතර කෙසේ බෙදිය හැකි ද යන ප්‍රශ්නය ය. වෙනත් ආකාරයකට ඉදිරිපත් කලොත්, ආන්ඩුව මුහුන දී තිබුනේ යලිත් ආයුධ සන්නද්ධ වීම සඳහා මහජනතාවගෙන් කොපමන කැපවීමක් අපේක්ෂා කල යුතුද යන තියුනු දේශපාලන ගැටලුව ය'' [3]

ලෝකයේ කවර කලෙකවත් දක්නට ලැබුනු අතිශයින්ම මෘග හා නිර්දය ඒකාධිපතිත්වය බලයට පත් කර ගැනීම ට ඒ වන විට ම සමත් වී සිටි රටකට ඉහත සඳහන් දෑ ගැටලුවක් වී නම් බුෂ් පාලනාධිකාරය මුහුන දී සිටුනා දේශපාලන උභතෝකෝටිකය ඊටත් වඩා තියුනු ය. බුෂ් පාලනය කෙරේ පෘථුල මහජන විරෝධය තවමත් පවතී. එම විරෝධතාවයට පවත්නා දේශපාලන ව්‍යුහය තුල ප්‍රකාශනයක් අත් කර ගැනීමට නොහැකිව ඇතැයි යන කාරනයට ම මෙම විභව සමාජ විරුද්ධත්වයට සුවිශේෂ පිපුරුම් සහගත ස්වභාවයක් අත්කර දේ.

සමාජවාදී සමානතා පක්ෂයේ කර්තව්‍යය වන්නේ ලෝක ආර්ථික අර්බුදයේ තර්කනය මත පදනම් වී, ඇමරිකා එක්සත් ජනපදයේ සමාජ අරගලයේ නව


**5 වගුව**




1947-2003 දක්වා 1,000 අධික කම්කරුවන් සම්බන්ධ වූ වැඩ වර්ජනවලට සම්බන්ධ වූ කම්කරු සංඛ්‍යාව. මූලාශ්‍රය, යූඑස් බියුරෝ ඔෆ් ස්ටැටිස්ටික්ස්.


පනගැන්වීමක් අපේක්ෂා කර ඇමරිකානු සමාජයේ විප්ලවවාදී බලවේගය වන කම්කරු පන්තිය වෙතට යොමු වී ගැනීම ය. 1870 ගනන් වල සිට 1980 ගනන් දක්වා එක්සත් ජනපදයේ සමාජ සට්ටනයේ ඉතිහාසය ගැන නොදන්නා, ඇමරිකා එක්සත් ජනපදය තුල ශතවර්ෂයකට වැඩි කාලයක් තිස්සේ සාම්ප්‍රදායිකව භාවිතයන් ලෙස පැවැති ස්ට්‍රයික් සටන්, පොලිසිය හා සටන්, මහා පෙලපාලි සහ පන්ති සටනේ ස්වරූප

**6 වගුව**




1947-2003 දක්වා 1,000 අධික කම්කරුවන් සම්බන්ධ වූ වැඩ වර්ජනවලින් පුහු වූ වැඩ දින සංඛ්‍යාව. මූලාශ්‍රය, යූඑස් බියුරෝ ඔෆ් ස්ටැටිස්ටික්ස්.

**7 වගුව**




1,000කට අධික කම්කරුවන් සම්බන්ධ වැඩ වර්ජන නිසා සමස්ත වැඩ කාලයෙන් අහිමි වූ පංගුව. (යූඑස් බියුරෝ ඔෆ් ලේබර් ස්ටැටිස්ටික්ස්)

දක්නට නොලැබුනු වාතාවරනයක හැදී වැඩී මෝරාගිය පරපුරට අප කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියාකලාපය පිලිබඳව කරන මෙම අවධාරනය මනෝරාජික යයි එසේත් නැතහොත් මුලුමනින්ම අරුම පුදුම යයි සිතෙනු ඇත. එහෙත් ඓතිහාසික අත්දැකීම් පෙන්නුම් කරන්නේ පසුගිය දශක එක හමාර තුල දක්නට ලැබෙන නිශ්චලතාව, වඩාත් නිවැරදිව කිවහොත් නිදිමත හා එක තැන පල්වීම ඇමරිකානු සමාජ ඉතිහාසයේ මූලික රටාවෙන් තියුනු ලෙස වෙනස් තත්වයක් නියෝජනය කරන බව ය.

එක්සත් ජනපදයේ පන්ති අරගලයේ මූලික දර්ශකයන් - වැඩ වර්ජන සංඛ්‍යාලේඛන - අධ්‍යයනය කලහොත් කෙනෙකුට තත්ක්ෂනිකව කාවදින්නේ පසුගිය දශක දෙක තුල සංවිධිත මහා පරිමාන පන්ති ක්‍රියා මුලුමනින්ම පාහේ නැති වී ගොස් ඇති බව ය. (5, 6 සහ 7 වගු බලන්න.) වැඩ වර්ජනවලට යෙදුනු කම්කරුවන් සංඛ්‍යාව, නැති වී ගිය වැඩ දින ගනන්, වඩාත්ම වැදගත්ව කිව හොත් සමස්ත වැඩ දින සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස, වැඩ වර්ජනයන් නිසා නැතිව ගිය වැඩ දින සංඛ්‍යාව යන මේ සියල්ල අර්ථ රහිත යයි කිය හැකි තරමට ම පහත වැටී ඇත. එහෙත් මෙම සංඛ්‍යා 1870 සිට 1980 දක්වා කාල පරිච්ඡේදයේ දී එක්සත් ජනපදයේ විකාශනය වූ මූලික රටාවට කිසිසේත් ම නො සැසඳේ.

ඇමරිකාවේ සමාජ සට්ටනයේ ඉතා මූලික වෛශයික දර්ශකයන් ගේ පුදුම සහගත පරිහානිය අර්ථ කථනය කල හැක්කේ කෙසේ ද? එක්කෝ ඇමරිකානු කම්කරු පන්තිය පසුගිය දශක දෙක තුල තමන්ගේ සමාජ තත්වය ඇද වැටීම මුලුමනින්ම නොතකා ගනන් නො ගෙන සිට ඇත. සමාජ අසමානතාවයේ පෙර නුවූ විරූ උග්‍ර වීම ඇති කරනු ලැබ තිබෙන්නේ ඇමරිකානු සමාජයේ සමාජ ආතතීන් සහ පිපිරුම් කිසිසේත් ම උග්‍ර කරන්නේ නැතිව ය.

එසේ නැතිනම් කම්කරු පන්තිය සම්ප්‍රදායිකව සමාජ අතෘප්තිය ප්‍රකාශනය කිරීමට යොදාගත් දේශපාලන ව්‍යූහය සහ සංවිධාන රූපාකාරයෝ කම්කරු පන්තික කෝපයේ සකල ප්‍රකාශනයක්ම පාගා දැමීම සඳහා වැඩට බැස ගත්තාහු ද? මෙම දෙවනු කී කාරනාව වඩාත් බෙහෙවින් පිලිගත හැකි අර්ථ කථනය යි. එයයි නිවැරදි අර්ථ දැක්වීම.

කම්කරු පන්තිය ස්වාධීන විප්ලවවාදී දේශපාලන බලවේගයක් හැටියට ඉස්මතුවීම හුදෙක් සංවිධානය පිලිබඳ ප්‍රශ්නයක් නොවේ; සමාජ විඥානය සහ දේශපාලන ඉදිරිදර්ශනය පිලිබඳ ප්‍රශ්නයක් ද වේ; ඉතිහාසයේ නියාමයන් ද ධනේශ්වර නිෂ්පාදන මාධ්‍යය ද තුලට න්‍යායික අභිනිවේශයක් පිලිබඳ ප්‍රශ්නයක්ද වේ. තිල කම්කරු ව්‍යාපාරය ඇමරිකා එක්සත් ජනපදය තුල සැලකිය යුතු බලපෑමක් අත් කර ගත් දශකයක් තුල දී, එය යෙදී ගත්තේ පන්ති විඥානයේ මෙම සාරභූත බුද්ධිමය සංරචකයන් මාත්‍රයක් හෝ නො තබා එලියට මිරිකා හැරීමට ය. එපමනක් නොව එහි ජාතික ප්‍රදේශවාදය ද, ඩිමොක්‍රැටික් පක්ෂය කෙරේ තිබූ වහල් යටත් භාවය ද 1980 ගනන්වල ධනේශ්වර ප්‍රහාරයට හා ධනේශ්වර ගෝලීය කරනයෙන් පැන නැගි නව

ආර්ථික තත්වයන්ට එරෙහි කුමන හෝ ප්‍රතිචාරයක් ඇති කිරීමට ඉඩක් තැබුවේ නැත.

ඇමරිකා එක්සත් ජනපදය තුල ද ජාත්‍යන්තරව ද සමාජ සහ පන්ති සට්ටනය අලුත් වීම අනිවාරනීය ය. දැන් අපගේ කර්තව්‍යය වන්නේ ලෝක පරිමානව පන්ති සට්ටනය අනිවාර්යයෙන් ම අලුත්වී ඒම ට සැරසී ගැනීම සඳහා  කම්කරු පන්තිය තම අරගලයන් පදනම් කර ගත යුතු වූ ජාත්‍යන්තර ඉදිරිදර්ශන හා ක්‍රියාමාර්ගය විස්තාරනය කිරීමේ ද, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* අනුහස පලල් කරමින් කම්කරුවන් හා තරුනයන් නව පරපුරකට සමාජවාදය හඳුන්වා දී ඔවුන් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අසදෘශ ඉතිහාසයෙන් උගන්වා ගැනීමේ ද ශක්ති සම්පන්නව යෙදී ගැනීම ය.

**සටහන්:**

1. *The U.S. as a Net Debtor: The sustainability of the U.S. External Imbalances*, [(එක්සත් ජනපදය ශුද්ධ නයකරුවෙක් ලෙසඃ එක්සත් ජනපදයේ බාහිර අසමතුලිතතාවයේ භාරතාව.) නවුරියෙල් රුබිනි සහ බ්‍රෙඩ් සෙට්සර් විසිනි. (නොවැම්බර් 2004) ]

2. "Sustained Budget Deficits: Longer-Run U.S. Economic Performance and the Risk of U.S. Financial and fiscal Disarray," [(‘දිගින් දිගටම අයවැය හිඟයඃ දිගු කාලයක් එක්සත් ජනපද ආර්ථික ක්‍රියාකාරිත්වය සහ එක්සත් ජනපදයේ මූල්‍යමය හා රාජ්‍යමූල්‍ය ව්‍යාකූලතාවේ අවදානම.’) ජනවාරි 4, 2004,] බලන්න. http://www.brook.edu/views/papers/orszag/20040105.pdf

3. *Nazism, Fascism and the Working Class*, [(නාසිවාදය, ෆැසිස්ට්වාදය සහ කම්කරු පන්තිය), ටිම් මේසන් විසිනි. (කේම්බ්‍රිජ් , එක්සත් රාජධානිය, 1985), පිටු.106.]

© www.wsws.org